Department of Examinations - Sri Lanka

Department of Examinations - Sri Lanka

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2021 (2022)

## 51 - චිත්‍ර කලාව

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

# 51 - චිත්‍ර කලාව - I, II, III

## ලකුණු දීමේ පටිපාටිය

චිත්‍ර කලාව I - මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය. I වන කොටස බහුවරණ ප්‍රශ්න 40 කින් ද දෙවන කොටස ව්‍යුහගත ප්‍රශ්න 07 කින් ද යුක්ත වේ. බහුවරණ පත්‍රය අනිවාර්ය වන අතර දෙවන කොටසට අයත් "අ" කොටසින් ප්‍රශ්න දෙකක් හා ආ, ඉ, යන අනු කොටස් දෙකෙන් එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් ප්‍රශ්න හතරක් තෝරාගත යුතු වේ. බහුවරණ ප්‍රශ්න 40 ට ලකුණු 40 ක් ලැබෙන අතර ව්‍යුහගත ප්‍රශ්න හතරට 15 බැගින් ලකුණු 60 ක් හිමි වේ. මේ අනුව ප්‍රශ්න පත්‍රයට ලකුණු 100 ක් ලැබේ.

චිත්‍ර කලාව II - ප්‍රායෝගික ප්‍රශ්න පත්‍රයකි. මෙහි ඇතුළත් වනුයේ එක් ප්‍රායෝගික ක්‍රියාකාරකමක් සඳහා වූ එක් ප්‍රශ්නයකි. "නිදහස් රේඛාමය ඇඳීම හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය" යනුවෙන් මෙය හැඳින්වේ. මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 100 ක් හිමි වේ.

චිත්‍ර කලාව III - ප්‍රායෝගික ප්‍රශ්න පත්‍රයකි. මෙය "අ" "ආ" "ඉ" යනුවෙන් කොටස් තුනකින් යුක්ත ය.

"අ" - චිත්‍ර සංරචනය
"ආ" - මෝස්තර නිර්මාණය
"ඉ" - ගැෆ්‍රික් චිත්‍ර නිර්මාණය

ඉහත සඳහන් කොටස් තුනෙන් එක් කොටසකින් එක් ප්‍රශ්නයක් පමණක් තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු වේ. මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 100 ක් හිමි වේ.

එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 100 බැගින් ප්‍රශ්න පත්‍ර තුනට ලකුණු 300 කි. එම පත්‍ර තුන වෙන වෙනම අගයා අදාල ලකුණු එම පත්‍රවල යොදන්න. පත්‍ර තුනේ ලකුණු එකතු කිරීම අවශ්‍ය නොවේ.



Department of Examinations - Sri Lanka

## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................................ √ △ $\frac{4}{5}$

(ii) ............................................................ √ △ $\frac{3}{5}$

(iii) ............................................................ √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.



Department of Examinations - Sri Lanka

## ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

## ලකුණු ලැයිස්තු සකස් කිරීම :

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***



Department of Examinations - Sri Lanka

## I පත්‍රය - චිත්‍ර කලාව

අභිමතාර්ථ :-

1. ශ්‍රී ලංකාව, ඉන්දියාව, යුරෝපය ආශ්‍රිත කලා නිර්මාණයන්ගේ සංස්කෘතික පසුබිම පිළිබඳ ශිෂ්‍යයා අත්පත් කරගෙන ඇති නිපුණතා පිරික්සීම.
2. විශ්ව ශිල්පීන් හා ඔවුන්ගේ කලා කෘති හඳුනාගෙන ඒවායේ පසුබිම, මාධ්‍ය භාවිතය, වස්තු විෂය, ශිල්ප ක්‍රම හා භාව ප්‍රකාශන පිළිබඳ ඇගයීමේ හා රසවිඳීමේ හැකියාව මැන බැලීම.
3. උගත් විෂය කරුණු නිරවුල්ව හා තර්කානුකූලව ඉදිරිපත් කිරීමේ හැකියාව මැන බැලීම.

පළමුවැනි ප්‍රශ්න පත්‍රයට ලකුණු දීමේදී කොටස් දෙක ගැන වෙන වෙන ම ලකුණු කිරීමට විශේෂයෙන් සැලකිලිමත් වන්න. පළමු වැනි කොටස වන බහුවරණ පත්‍රයට පිළිතුරු සපයා ඇත්තේ එම පත්‍රයේම බැවින් නිවැරදි හරි වැරදි ලකුණු කොට නිවැරදි පිළිතුරු ගණනය කොට හිමි ලකුණ පිළිතුරු පත්‍රයේ ඉහළ දකුණු කෙළවරේ අදාල කොටුව තුළ යොදන්න. දෙවන කොටසේ තෝරාගෙන ඇති ප්‍රශ්න හතර වෙන් වෙන්ව අගයා එකිනෙක කොටස් වලට හිමි ලකුණු නිවැරදිව අදාල පිළිතුර අවසානයේ ලියා එකතුකොට දක්වන අතර එම ප්‍රශ්න හතරේ එකතුව බහුවරණ පත්‍රයේ ඉදිරි පිටුවේ ඉහළ දකුණු කෙළවරේ අදාල කොටුව තුළ යොදා එකතු කරන්න.

අවසානයේ එකිනෙක පිළිතුරට හිමි ලකුණ අදාල ප්‍රශ්න අංක යටතේ මුල් පිටුවට ගෙන පිළිතුරු සියල්ලේ ම එකතුව නිවැරදිව ගණනය කොට 1 වැනි පත්‍රයට හිමි කොටුව තුළ යොදන්න.

ලකුණු කරන ලද සෑම උත්තර පත්‍රයක් ම වෙනත් අයෙකු විසින් පරීක්ෂා කළ යුතුවේ. මුල් පරීක්ෂකවරයාත් දෙවනුව පරීක්ෂා කරන පරීක්ෂකවරයාත් තම සංකේත අංකය අනිවාර්යයෙන්ම පිළිතුරු පතේ සටහන් කළ යුතු ය.

ලකුණු ලැයිස්තු පිළියෙල කිරීමේදී ද තම තමන් විසින්ම කළ යුතු ය. කියවන විට ලිවීම නොකළ යුතු වේ. එකිනෙක ප්‍රශ්නයට හිමි ලකුණ මුල් පිටුවට ගැනීමේදීත් එම ලකුණු, ලකුණු ලැයිස්තුවට ගැනීමේදීත් ඉතා නිවැරදිව කළ යුතුය. සෑම ඉලක්කමක්ම නිවැරදිව ලිවිය යුතු සේම ඉතා පැහැදිලිව තිබීම ද වැදගත්ය. ඉලක්කමක් වැරදුනහොත් එක ඉරකින් කපා නැවත ලියා අත්සන යොදන්න. මැකීම හෝ සීරීම හෝ මකන දියර භාවිතය නොකළ යුතු ය.

අපේක්ෂකයන් නියමිත ප්‍රමාණයට වඩා පිළිතුරු ලියා තිබෙන්නට පිළිවන. එවැනි අවස්ථාවල දී සියලුම පිළිතුරු ලකුණු කොට අඩු ලකුණු ලබාගත් වැඩිපුර ලියා ඇති පිළිතුරු කපා හරින්න. කොටස් තුනෙන් නියමිත ප්‍රමාණය නොසලකා ලියා ඇති අවස්ථාවලදී ද එම පිළිතුරු කපා හරින්න. කපා හරින ලද පිළිතුරු සම්බන්ධයෙන් පහතින් සටහනක් යොදන්න. පිළිතුරු පත් පළමු ලකුණු කිරීම සඳහා රතුපාට පෑනක් භාවිත කිරීම අනිවාර්ය වේ.

AL/2021(2022)/51/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

**51 S I**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : .................................

**උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත ය.

**I කොටස**
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

**II කොටස**
- අනුකොටස් තුනකින් සමන්විත ය.
  'අ' කොටසින් ප්‍රශ්න දෙකක් හා 'ආ' සහ 'ඉ' යන කොටස් දෙකෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

※ I කොටසට හා II කොටසට අයත් පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

| පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණයි. | |
|---|---|
| I පත්‍රය සඳහා | |
| කොටස | ලකුණු |
| I | |
| II | |
| එකතුව | |
| 1 වැනි පරීක්ෂක | 2 වැනි පරීක්ෂක |

## I කොටස

● ප්‍රශ්න අංක 1 සිට 5 තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. 'සංඛනිධි' හා 'පද්මනිධි' රූ සහිත මුරගල් යුගල දක්නට ලැබෙන ස්ථානය වන්නේ,
   (1) ථූපාරාම ස්තූපයයි. (2) ලංකාරාම ස්තූපයයි.
   (3) අභයගිරි ස්තූපයයි. (4) මැදිරිගිරිය වටදාගෙයයි.
   (5) ලංකාතිලක පිළිමගෙයයි. (.........)

2. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වූ කලා කෘති අතර ස්වභාවිකත්වයට සමීප රුවක් වන්නේ,
   (1) ශිව පශුපති ය. (2) කවන්ධ රූපය ය.
   (3) නළඟන රුව ය. (4) තාපස රුව ය.
   (5) මාතෘ දෙවඟන ය. (.........)


3. දඹුල්ල ලෙන් විහාරය,
   (1) මහනුවර යුගයට අයත් බිතු සිතුවම් විශාල සංඛ්‍යාවක් ඇති ස්ථානයකි.
   (2) කඩොල්ගල්ල සිත්තර පරම්පරාවේ ශිල්පීන් විසින් කළ සිතුවම් සහිත ස්ථානයකි.
   (3) අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා වූ සිතුවමින් අලංකාර වූවකි.
   (4) නිලගම සිත්තර පරපුර විසින් අඳින ලද බිතු සිතුවම් දක්නට ඇති ස්ථානයකි.
   (5) ජාතක කථා විශාල සංඛ්‍යාවක් සිතුවමට නගා ඇති ස්ථානයකි. (.........)


[දෙවැනි පිටුව බලන්න.

4. ඊජිප්තුවේ නව රාජධානි යුගයේ දී,
   (1) පිරමිඩ වෙනුවට දේවස්ථාන ඉදිකිරීමට පෙළඹී තිබේ.
   (2) නයිල් මිටියාවතෙහි බොහෝ පිරමිඩ ඉදිකෙරිණ.
   (3) ප්‍රමාණයෙන් විශාල පිරමිඩ ගණනාවක් ඉදිවී තිබේ.
   (4) පාරාවෝවරුන්ගේ ලෞකික දිවිය උදෙසා මාළිගා ඉදි විය.
   (5) විශාල පිරමිඩ වෙනුවට කුඩා ප්‍රමාණයේ ඒවා ඉදිකෙරිණ. (.........)

5. ග්‍රීක සම්භාව්‍ය යුගයට අයත් මූර්තියක් වන්නේ,
   (1) වීනස් ඩි මේලෝ ය.
   (2) ලැවොකූන් ය.
   (3) විජයග්‍රහණයේ දෙවඟන ය.
   (4) මියැදෙන ගෝල්වරයා ය.
   (5) හර්මීස් හා ඩයොනීසස් ය. (.........)


● ප්‍රශ්න අංක 6 සිට 10 තෙක් අසා ඇති ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර 1 සිට 7 තෙක් අංක කර ඇති පහත සඳහන් වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් තෝරන්න.



1



2


3


4


5


6


7

6. බෞද්ධාගමික ඉදිකිරීම් ලෙස සැලකිය හැක්කේ,
   (1) 1, 2, 5 (2) 1, 3, 4 (3) 2, 4, 5 (4) 3, 5, 7 (5) 4, 5, 7 (.........)

7. මේවා අතරින් ඉන්දියාවේ පිහිටි ඉදිකිරීම් වනුයේ,
   (1) 1, 4 (2) 4, 5 (3) 4, 6 (4) 4, 7 (5) 6, 7 (.........)

8. ඉන්දීය කලා ලක්ෂණ මැනවින් දිස්වන ඉදිකිරීම් වනුයේ,
   (1) 1, 2, 5, 6 (2) 1, 4, 5, 7 (3) 1, 5, 6, 7 (4) 2, 3, 4, 5 (5) 2, 3, 5, 7(.........)

9. ආගමික නොවන ඉදිකිරීම් ලෙස දැක්විය හැක්කේ,
   (1) 2, 3, 6 (2) 3, 4, 5 (3) 3, 4, 6 (4) 3, 6, 7 (5) 4, 6, 7 (.........)

10. පොළොන්නරු යුගයට අයත් ඉදිකිරීම් වනුයේ,
   (1) 1, 2, 6 (2) 1, 5, 6 (3) 1, 6, 7 (4) 2, 3, 5 (5) 4, 5, 6 (.........)

[තුන්වැනි පිටුව බලන්න.



Department of Examinations - Sri Lanka

● ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් ගැළපෙන පිළිතුර A, B, C, D, E ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.



A B C D E

11. A අක්ෂරයෙන් දැක්වෙන 'ඉන්ද්‍රානි' නමැති චිත්‍රය,
   (1) මුදලිඳු අමරසේකරගේ ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී නිර්මාණයකි.
   (2) ස්ටැන්ලි අබේසිංහගේ නූතනවාදී කාන්තා ආලේඛ්‍යයකි.
   (3) හැරී පීරිස්ගේ ප්‍රකාශනවාදී ලක්ෂණ සහිත ආලේඛ්‍ය සිතුවමකි.
   (4) අයිවන් පීරිස්ගේ නූතනවාදී කාන්තා රූපයකි.
   (5) ජේ.ඩී.ඒ. පෙරේරාගේ ස්වභාවිකවාදී කෘතියකි. (.........)

12. B අක්ෂරයෙන් දැක්වෙන රාජා රවි වර්මාගේ 'සරස්වතී' නම් වූ සිතුවමින්,
   (1) යුරෝපීය නූතන කලාවේ ශිල්පක්‍රම ඇසුරින්, ඉන්දීය වස්තු විෂයයක් නිරූපිත ය.
   (2) ඇන්ග්ලෝ-ඉන්දියානු සම්ප්‍රදාය අතික්‍රමණය කරමින්, දේව භක්තිය නිරූපණය වේ.
   (3) යුරෝපීය අධියථාර්ථවාදී ශිල්පක්‍රම අනුව, හින්දු දේව කථාවක එන චරිතයක් නිරූපිත ය.
   (4) යුරෝපීය නූතනවාදී කලා ලක්ෂණ සහිතව, ඉන්දීය පුරාණෝක්තියක් නිරූපිත ය.
   (5) යුරෝපීය ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලා ලක්ෂණ අනුව ඇඳි හින්දු දේවතා රුවක් නිරූපණය වේ. (.........)

13. C අක්ෂරයෙන් දැක්වෙන එල්.ටී.පී. මංජු ශ්‍රී විසින් අඳින ලද සිතුවම,
   (1) දිය සායම් මාධ්‍යයෙන්, කාන්තා සිරුරේ රිද්මය ස්වභාවිකව නිරූපණයට ගත් උත්සාහයකි.
   (2) ශෛලිගත ලක්ෂණ අතිශයෝක්තියෙන් නිරූපණය වන සේ අඳින ලද්දකි.
   (3) නූතන යුරෝපීය කලාවේ ප්‍රයෝගයන්හි සහ පෙරදිග ශෛලිගත ලක්ෂණයන්හි සම්මිශ්‍රණයකි.
   (4) ශාස්ත්‍රාලීය යථාර්ථවාදී කලාවේ ලක්ෂණ පිළිබිඹු කරන්නකි.
   (5) තෙල් සායම් භාවිතයෙන්, නව උපස්ථිතිවාදී ශිල්ප ක්‍රම අනුව අඳින ලද්දකි. (.........)

14. D අක්ෂරයෙන් දැක්වෙන 'කැඩපත අසල සිටින ගැහැනිය' නම් වූ සිතුවම,
   (1) සාම්ප්‍රදායික චිත්‍ර ශෛලියක් එලෙසින්ම අනුගමනය කිරීමකි.
   (2) සංකේතාත්මකව ඉදිරිපත් කළ දෘශ්‍ය ප්‍රකාශනයකි.
   (3) ප්‍රකෘති ස්වභාවය කලාත්මක ප්‍රකාශනයක් බවට පරිවර්තනය කිරීමකි.
   (4) අර්ධ වියුක්තකරණයක් සහිතව නිරූපිත කාන්තා රූපයකි.
   (5) ශෛලිගත ආකාරයෙන් කාන්තා රුව සිතුවම් කිරීමකි. (.........)

15. E අක්ෂරයෙන් දැක්වෙන මොන්ඩ්‍රියන්ගේ සිතුවම,
   (1) තිරස් හා සිරස් රේඛාවන්ගෙන් ගොඩනැගෙන හැඩතල සම්මිශ්‍රණය කිරීමකි.
   (2) ගැටුමක් මෙන්ම සුසංයෝගයක් ද මතුවන පරිදි විවිධ වර්ණ චතුරස්‍ර ස්ථානගත කිරීමකි.
   (3) රේඛා, වර්ණ, අවකාශ භාවිතයෙන් වර්ණයන්ගේ ගැඹුර ප්‍රකාශ කිරීමකි.
   (4) චතුරස්‍රාකාර ආකෘති මගින් ගොඩනැගූ පරිකල්පිත සංරචනයකි.
   (5) සරල රේඛා හා චතුරස්‍ර හැඩ මගින් කැන්වසය මත ගොඩනැගූ සංරචනයකි. (.........)

[අනෙක් පිටුව බලන්න.



Department of Examinations - Sri Lanka

- ප්‍රශ්න අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් යෝග්‍ය වරණය පහත සඳහන් **F, G, H, I, J** ලෙස නම් කර ඇති කැටයම් ඡායාරූප ඇසුරෙන් තෝරන්න.



F G H I J

**16.** F අක්ෂරයෙන් දැක්වෙන මෙම කැටයම,
(1) පිරිමි රුවේ ප්‍රබෝධයත්, කාන්තා රුවේ ශෝකයත් දැක්වීමට ගත් උත්සාහයකි.
(2) තෙළිමේ ශිල්ප ක්‍රමය උපයෝගී කොට ගනිමින් කළ දිව්‍යමය ප්‍රකාශනයකි.
(3) රාජකීයත්වය නිරූපණය වන අයුරින් කළ, පල්ලව කලා ලක්ෂණ සහිත ඵලකයකි.
(4) ගුප්ත කලා ලක්ෂණ සහිත භාවපූර්ණ හා ලාලිත්‍යමය ප්‍රකාශනයකි.
(5) මානව රූ දෙකක් එක්කොට කරන ලද ශෘංගාරාත්මක සංරචනයකි. (.........)

**17.** G අක්ෂරයෙන් දැක්වෙන දැවමය පනේල කැටයම,
(1) ඇම්බැක්ක දේවාලයේ ඇති, මව් සෙනෙහස ප්‍රකාශිත කැටයමකි.
(2) පනාවිටිය අම්බලමේ දක්නට ඇති, සාමාන්‍ය ජන ජීවිතය නිරූපිත අවස්ථාවකි.
(3) මහනුවර මගුල් මඩුවේ ඇති, රාජකීය පවුලක් දැක්වෙන කැටයමකි.
(4) ඇම්බැක්ක දේවාලයේ දක්නට ඇති, දේව කතාවක් වස්තු විෂය කොටගත් අවස්ථාවකි.
(5) පනාවිටිය අම්බලමෙහි ඇති, ප්‍රභූ කාන්තාවක් සහ පරිවාර ස්ත්‍රියක් දැක්වෙන කැටයමකි. (.........)

**18.** H අක්ෂරයෙන් දැක්වෙන භාරුත් නටඹුන් අතරින් හමු වී ඇති කැටයම,
(1) සිදුවීම් කිහිපයක් එකම පනේලයක අල්ප උන්නතව සංරචනය කළ අවස්ථාවකි.
(2) ජාතක කථාවක් වස්තු විෂය කරගත් අර්ධ උන්නත පනේලයකි.
(3) බුද්ධ චරිතය හා සම්බන්ධ ප්‍රකට සිද්ධියක් මුල්කොට ගත්තකි.
(4) ගල්වැටෙහි අලංකරණ අංගයක් ලෙස කැටයම් කළ සමකාලීන සිදුවීමකි.
(5) අඛණ්ඩ කථන ශෛලියෙන් නිර්මිත අල්ප උන්නත පුවරු කැටයමකි. (.........)

**19.** I අක්ෂරයෙන් දැක්වෙන කැටයම,
(1) බුද්ධ චරිතය හා සම්බන්ධ පුරාවෘත්තයක් නිරූපණය වන්නකි.
(2) සිදුහත් කුමරු උයන්කෙළි සඳහා යන අවස්ථාව සංකේතවත් කරන්නකි.
(3) අමරාවතී ප්‍රදේශයෙන් හමුවූ රාජකීය පෙරහැරක් දක්වන්නකි.
(4) සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණය නිරූපණය වන්නකි.
(5) යුධබිමට යන අශ්වාරෝහකයෙකු නිරූපණය වන්නකි. (.........)

**20.** J අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) මෙන්කුරේ රජු සතුරන් සමග යුද වදින අයුරු දැක්වෙන කැටයමකි.
(2) පාරාවරුන්ගේ සටන් දර්ශන ඇතුළත් පාෂාණමය ඵලකයකි.
(3) හොරස් දෙවියන් සමග කෙරෙන සටන් දර්ශන ඇතුළත් කැටයමකි.
(4) කාෆ්රේ රජුගේ ජීවිත තොරතුරු ඇතුළත් කැටයම් පුවරුවකි.
(5) නාමර් රජුගේ යුද ජයග්‍රහණ සංකේතාත්මකව දැක්වෙන කැටයම් ඵලකයකි. (.........)

[පස්වැනි පිටුව බලන්න.

- ප්‍රශ්න අංක **21** සිට **25** තෙක් ඇති එක් එක් ප්‍රකාශයට වඩාත් ගැළපෙන වරණය පහත සඳහන් **K, L, M, N, O** යනුවෙන් නම් කර ඇති කලා කෘති ඇසුරෙන් තෝරන්න.


K


L


M


N


O

**21.** **K** අක්ෂරයෙන් දැක්වෙන ගල් විහාරයේ සමාධි බුදු පිළිමය,
(1) පල්ලව ආභාසය මත නිම කෙරුණකි.
(2) මහායාන සංකල්පයක් අනුව තෙලන ලද්දකි.
(3) අමරාවතී ශෛලියෙන් කරන ලද්දකි.
(4) මථුරා කලා සම්ප්‍රදාය මත නිමවූවකි.
(5) ගුප්ත ආභාසයෙන් යුතුව නිම කෙරුණකි. (.........)

**22.** **L** අක්ෂරයෙන් දැක්වෙන අර්ධනාරී පිළිරුව,
(1) පොළොන්නරු යුගයෙන් හමුවූ ලෝහ වාත්තු පිළිමයකි.
(2) වම් අර්ධය කාන්තා ස්වරූපයෙන් නිමවා ඇති පිළිමයකි.
(3) ස්ත්‍රී ශරීරයේ සුන්දරත්වය ප්‍රකාශ කෙරෙන මූර්තියකි.
(4) 'ස්ත්‍රිය පුරුෂයාට වඩා බලවත් ය' යන්න නිරූපිත කෘතියකි.
(5) අභයගිරි විහාර භූමියෙන් හමුවූ ලෝකඩ පිළිමයකි. (.........)

**23.** **M** අක්ෂරයෙන් දැක්වෙන ගන්ධාරයෙන් හමුවූ බ්‍රෝගම් පිළිමය,
(1) යමක ප්‍රාතිහාර්ය නිරූපිත පිළිමයක් සේ පිළිගැනේ.
(2) මනා තිමාවකින් සහ රැළි සහිත චීවරයකින් සමන්විත වේ.
(3) අභය මුද්‍රාව නිරූපණය වන බුදු පිළිමයක් සේ සැලකේ.
(4) ඉන්දියානු කලා ලක්ෂණ පෙන්නුම් කෙරෙන බැව් පිළිගැනේ.
(5) නිවැරදි පරිමාණයට අනුව නිම කළ පිළිමයකි. (.........)

**24.** **N** අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය,
(1) චෝල සම්ප්‍රදායට අයත් දේවාලයක පිටත බිත්තියෙහි ඇති ශිව භික්ෂාටන රූපයකි.
(2) නුග ගසක් යට රාජලීලාසනයෙන් සිටින කල්‍යාණ සුන්දර මූර්තියකි.
(3) රාජ රාජේශ්වර දේවාලයේ වම්පස කුටියක කැටයම් කර ඇති ශිව දේව රූපයකි.
(4) සියලු දැනුම්වල ගුරුවරයාගේ වේශයෙන් පෙනී සිටින ශිව දක්ෂිණ මූර්ති රූපයකි.
(5) ශෛලීගත ආකාරයෙන් තෙළා ඇති, විෂ්ණු දේව රූපයකින් සමන්විත ගෝපුර කැටයමකි. (.........)

**25.** **O** අක්ෂරයෙන් දැක්වෙන 'චින්තකයා' මූර්තියෙන් රොඩැන් උත්සාහ කර ඇත්තේ,
(1) මිනිස් සිරුරේ හැඩි දැඩි බව සුමට ලෙස මූර්තිමත් කිරීමටයි.
(2) භාව ප්‍රකාශනය සඳහා පරිපූර්ණ නිමාවකින් යුතු මානව රූපයක අවශ්‍යතාව දැක්වීමටයි.
(3) අසම්පූර්ණ නිමාව පවා කලාත්මක මූලධර්මයක් බව තහවුරු කිරීමටයි.
(4) කලකිරීම නිසා ඇති වූ අපේක්ෂා භංගත්වය හැඩි දැඩි ශරීර ලක්ෂණ සහිතව පෙන්වීමටයි.
(5) ගැඹුරු භාව ප්‍රකාශනයක් සඳහා නග්න මිනිස් ශරීරය උපයෝගි කොටගත හැකි බැව් පෙන්වීමටයි. (.........)

[හයවැනි පිටුව බලන්න.



Department of Examinations - Sri Lanka

● ප්‍රශ්න අංක **26** සිට **30** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන පිළිතුර** තෝරන්න.

**26.** වර්තමානයේ දෘශ්‍ය කලාව යනුවෙන් හඳුන්වන්නේ,
(1) ඇස මුල්කරගෙන, දැකීමට සලස්වන නිර්මාණයන් වේ.
(2) ද්‍රව්‍ය මාධ්‍ය ඇසුරෙන් ගොඩනගා, කරනු ලබන නිර්මාණයි.
(3) ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට පැවත ආ චිත්‍ර කලාවයි.
(4) වර්ණ මාධ්‍යයෙන් කරනු ලබන ආකර්ශණීය ප්‍රකාශනයි.
(5) චිත්‍ර, මූර්ති, ගෘහනිර්මාණ යන කලා අංගයන්ගේ එකතුවයි. (.........)

**27.** වාණිජමය ග්‍රැෆික් නිර්මාණකරණයේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ,
(1) නිෂ්පාදන අලෙවියේ දී වැඩි ප්‍රතිලාභයක් ලබාදීමයි.
(2) මුද්‍රණ කටයුතු වඩාත් කාර්යක්ෂමව හා ක්‍රමවත්ව කරගැනීමට හැකිවීමයි.
(3) නිෂ්පාදන නාමය වඩාත් ඉස්මතු වන පරිදි සන්නිවේදනය කිරීමයි.
(4) නිෂ්පාදන හා සේවා පිළිබඳව ඍජුව හා වක්‍රව සන්නිවේදනය කිරීමයි.
(5) නිෂ්පාදනයට අවශ්‍ය ලේබල හා ඇසුරුම් නිර්මාණය කර ගැනීමයි. (.........)


**28.** මෝගල් චිත්‍ර කලාව,
(1) ජෙහාන්ගීර් විසින් ඉන්දියාවට හඳුන්වාදෙන ලද ක්ෂුද්‍ර චිත්‍ර සම්ප්‍රදායයි.
(2) අවුරන්ගෙබ් විසින් ඉන්දියාව පුරා ව්‍යාප්ත කරන ලද්දකි.
(3) පර්සියන් ආභාසය මත ඉස්ලාමීය පාලකයින් විසින් ප්‍රචලිත කරන ලද්දකි.
(4) ඉන්දීය සාහිත්‍යයේ එන සිද්ධි නිරූපණය කිරීමට යොදාගත් චිත්‍ර සම්ප්‍රදායයි.
(5) ඉස්ලාම් භක්තිකයින් විසින් හඳුන්වා දෙන ලද ආගමික චිත්‍ර සම්ප්‍රදායයි. (.........)

**29.** ඝනිකවාදී කලාකරුවන්ගේ අරමුණ වූයේ,
(1) වස්තුවක් දෙස බලන කෝණය වෙනස් කිරීමයි.
(2) දෘශ්‍ය අරමුණු පවතින අයුරින්ම අනුකරණය කිරීමයි.
(3) යථාර්ථවාදී නොවන කලාත්මක රීතීන් අනුගමනය කිරීමයි.
(4) වස්තූන් ජ්‍යාමිතික හැඩතල ඇසුරෙන් විග්‍රහ කිරීමයි.
(5) සොබාදහමේ ඇති වස්තූන් නිශ්චල ස්වරූපයෙන් දැක්වීමයි. (.........)

**30.** ඊජිප්තු වාස්තු විද්‍යාවට මූලික පදනම වූයේ,
(1) පාරාවෝවරුන් වෙනුවෙන් ලෞකික ගොඩනැගිලි සෑදීමේ අවශ්‍යතාවයි.
(2) මරණින් මතු ආත්මයේ පැවැත්ම සඳහා වූ ඇදහිලි පද්ධතියයි.
(3) මළවුන්ගේ මෘත ශරීර නැත්පත් කර තැබීමේ අවශ්‍යතාවයි.
(4) පාරාවෝවරුන්ගේ බල පරාක්‍රමය දැක්වීමට ගත් උත්සාහයයි.
(5) පාරාවෝවරුන්ගේ ජීවිතය පිළිබඳ සිහිවටන තැබීමේ උවමනාවයි. (.........)


● ප්‍රශ්න අංක **31** සිට **35** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** ඊට ඉදිරියෙන් දී ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් තෝරන්න.

**31.** ගල් පවුරකින් ආවරණය වූ මෙම බෝධිඝරය පිහිටා ඇත්තේ,



(1) පඬුවස්නුවර ය.
(2) පඩිකෙමිගල ය.
(3) නිල්ලක්ගම ය.
(4) හත්ථිකුච්ඡි විහාරයේ ය.
(5) ලාහුගල මගුල් මහා විහාරයේ ය. (.........)

**32.** අනුරාධපුර යුගයේ ඉදි වූ මෙම ගොඩනැගිල්ල,



(1) මහමෙවුනා උයනේ පිහිටි උපෝසථඝරයයි.
(2) ගල්කණු සමූහයක් මත ඉදිකළ ප්‍රාසාදයකි.
(3) දුටුගැමුණු රජු විසින් කරවන ලද සන්නිපාත ශාලාවකි.
(4) ගල්කණු මත තැනූ රාජකීය මන්දිරයකි.
(5) භික්ෂූන් වහන්සේලා සඳහා ඉදිවූ නව මහල් ප්‍රාසාදයකි. (.........)


[හත්වැනි පිටුව බලන්න.

Department of Examinations - Sri Lanka




**33.** දැනට නටබුන් වී ඇති මෙම වාස්තු විද්‍යා නිර්මාණය,
(1) අනුරාධපුරයේ විජයබාහු රජ මාලිගයයි.
(2) පොළොන්නරුවේ විජයබාහු රජ මාලිගයයි.
(3) පරාක්‍රම සමුද්‍රය අසල පිහිටි නිශ්ශංකමල්ල රජ මාලිගයයි.
(4) පොළොන්නරුවේ ලංකාතිලක පිළිමගෙයයි.
(5) පරාක්‍රමබාහු රජුගේ මාළිගය වූ විජයොත්පායයි.

(.........)



**34.** මෙම ටාජ්මහල් මන්දිරය,
(1) මෝගල් පාලන සමයේ ඉදිකළ ප්‍රාසාදයකි.
(2) අග්‍රා නගරයේ ඉදිවූ ආගමික ස්මාරකයකි.
(3) මෝගල් සමයේ කිරිගරුඬ පාෂාණයෙන් කළ මන්දිරයකි.
(4) හුමායන් රජ සිහිවීම පිණිස ඉදිකළ ගොඩනැගිල්ලකි.
(5) ගෝලාකාර ශිඛර සහිත ඉස්ලාමීය මන්දිරයකි.

(.........)



**35.** දැනට ශේෂ වී පවත්නා මෙම කොලෝසියම් ගොඩනැගිල්ල,
(1) විවෘත රඟමඬල පිළිබඳ සංකල්පයේ ආරම්භක අවස්ථාවයි.
(2) ග්‍රීක සම්භාව්‍ය ගෘහනිර්මාණ ආකෘතියකට අනුව ඉදිවූවකි.
(3) රෝමවරුන්ගේ බලය පිළිබඳ ප්‍රකාශනයක් වූ රාජකීය ගොඩනැගිල්ලකි.
(4) රෝමවරුන්ගේ යුධ ජයග්‍රහණ සිහිපත් කරන දැවැන්ත ඉදිකිරීමකි.
(5) රෝම නගරයේ ඉදිවූ ඕවලාකාර සැලැස්මකින් යුතු රඟමඬලකි.

(.........)

● ප්‍රශ්න අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන පිළිතුර** පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.



**36.** මෙම සිතුවම දක්නට ලැබෙන්නේ,
(1) තෙල්වත්ත රජමහ විහාරයේ ය.
(2) දඹුල්ල ලෙන් විහාරයේ ය.
(3) කතළුව පූර්වාරාමයේ ය.
(4) මුල්කිරිගල රජමහ විහාරයේ ය.
(5) කරගම්පිටිය සුබෝධාරාමයේ ය.

(.........)

[අවවැනි පිටුව බලන්න.

37. මෙම සිතුවමට වස්තු විෂය වී ඇත්තේ,
(1) බෞද්ධ පෙරහැරක දර්ශනයකි.
(2) නැටුම්, ගැයුම් ඉදිරිපත් කරන ශිල්පීන් පිරිසකි.
(3) තේලපත්ත ජාතකයෙහි එක් අවස්ථාවකි.
(4) වෙස්සන්තර ජාතකයෙහි ඇතුළත් සිදුවීමකි.
(5) විහාරස්ථානයක තේවාව පවත්වන ආකාරයයි. (.........)

38. මෙම සිතුවමෙහි ශෛලිය අනුව එය අයත් වන්නේ,
(1) පොළොන්නරු යුගයේ අගභාගයේ දී අභාවයට ගිය චිත්‍ර සම්ප්‍රදායකට ය.
(2) දහනව වැනි සියවසේ මුල් භාගයේ දී බිහි වූ පහතරට සිතුවම් සම්ප්‍රදායට ය.
(3) උඩරට රාජධානිය බිඳවැටීමෙන් පසු ඇති වූ ජනකලා සම්ප්‍රදායකට ය.
(4) දහඅට වැනි සියවසේ අග භාගයේ දී බිහි වූ මධ්‍යම මහනුවර සම්ප්‍රදායට ය.
(5) මහනුවර රාජධානි සමයේ පැවති ප්‍රාදේශීය ශෛලියකට ය. (.........)

39. මෙම සිතුවමෙහි,
(1) චලන ඉරියව් සාම්ප්‍රදායික ලක්ෂණ අනුව තලය මත ගොනු කිරීමට උත්සාහ කර ඇත.
(2) රූප එකිනෙක ගැළපීමේ දී චලනය හා ක්‍රියාකාරීත්වය අතිශෝක්තියෙන් දක්වා ඇත.
(3) සංරචනමය උපක්‍රමයක් ලෙස කාන්තා රූප කවාකාර ආකෘතියකින් ගොනුකර ඇත.
(4) රිද්මයානුකූල ගලායාම මගින් සංරචනයේ ජීව ගුණය වඩාත් ඉස්මතු වී ඇත.
(5) පාර්ශවදර්ශී මානව රූප සංයමයෙන් යුතුව තලය මත හසුරුවා ඇත. (.........)

40. මෙම සිතුවමෙහි දිස්වන විශේෂ ලක්ෂණයක් වන්නේ,
(1) තාරුණ්‍යයේ ලාලිත්‍යමය ගුණය මනාව චිත්‍රමය භාෂාවකට ගොනු කර තිබීමයි.
(2) ශ්‍රවණේන්ද්‍රිය ආකර්ෂණය කරගැනීමේ ආදීනව පෙන්වීමට උත්සාහ දැරීමයි.
(3) නාටිකාංගනාවන්ගේ ක්‍රියාකාරී ඉරියව්වල ජීවී ස්වභාවය පෙන්නුම් කර තිබීමයි.
(4) රඟන වයන ක්‍රියාකාරී ඉරියව් මගින් නාටෝචිත අවස්ථාවක් නිරූපණය කර දැක්වීමයි.
(5) ශෘංගාරය කැටි වූ කාන්තා රූපවල ජීවී ගුණය ගෙනහැර දැක්වීමට උත්සාහ කිරීමයි. (.........)

* *

[නවවැනි පිටුව බලන්න.



Department of Examinations - Sri Lanka

Department of Examinations - Sri Lanka

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## இலங்கைப் பரீட்சைத் திணைக்களம்

### අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2021(2022)

විෂය අංකය / பாட இலக்கம்: **51**

විෂයය / பாடம்: **චිත්‍ර කලාව**

### ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 3 | 21. | 2 | 31. | 3 |
| 02. | 2 | 12. | 5 | 22. | 5 | 32. | 1 |
| 03. | 4 | 13. | 3 | 23. | 1 | 33. | 5 |
| 04. | 1 | 14. | 4 | 24. | 4 | 34. | 3 |
| 05. | 5 | 15. | 2 | 25. | 3 | 35. | 5 |
| 06. | 1 | 16. | 4 | 26. | 1 | 36. | 4 |
| 07. | 4 | 17. | 1 | 27. | 4 | 37. | 3 |
| 08. | 4 | 18. | 1 | 28. | 3 | 38. | 2 |
| 09. | 4 | 19. | 4 | 29. | 4 | 39. | 1 |
| 10. | 2 | 20. | 5 | 30. | 2 | 40. | 2 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 40 = 40

## II කොටස

1. අනුරාධපුර යුගයේ පැවති බිතු සිතුවම් සම්ප්‍රදාය පොළොන්නරු යුගය අවසානය දක්වාම ක්‍රමිකව විකාශනය වෙමින් පැවත ආ බවට සාක්ෂි තිබේ.

   (i) හිඳගල ලෙන් විහාරයේ පැරණි බිතු සිතුවම් අතරින් ශේෂ වී තිබූ බිතු සිතුවම් කොටස සඳහා යොදාගෙන ඇති තේමා **දෙක** නම් කරන්න. (ලකුණු 2 යි.)

   (ii) සීගිරි බිතු සිතුවම් අතර කාන්තා රූපය විවිධත්වයෙන් යුතුව චිත්‍රණය කර ඇති ආකාරය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

   (iii) පොළොන්නරුව තිවංක පිළිමගෙයි පැරණි චිත්‍ර හා මහියංගන ධාතු ගර්භයේ සිතුවම් පිළිබඳව සංසන්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 8 යි.)

1. (i)

- තපස්සු භල්ලුක සහ වෙළඳ දෙබෑයන්ගේ විළඳ මී පිඩු පූජාව (වම්පස)
- දහම් දෙසීමට කෙරෙන සහම්පති මහා බ්‍රහ්මයාගේ ආරාධනාව (දකුණුපස)
- ශක්‍ර දේවේන්ද්‍රයා බුදුන් වහන්සේ හමු වීමට ඉන්ද්‍රසාල ගුහාවට පැමිණීම.

**(ලකුණු 02 යි)**

(ii)

- අනුරාධපුර යුගයට අයත් හොඳින් ආරක්ෂා වී තිබෙන සිතුවම් වශයෙන් සීගිරි සිතුවම් දැක්විය හැකිය.
- මෙහි දැක්වෙන කාන්තා රූප මගින් උඩුකය පමණක් නිරූපණය වන අතර කායික සුන්දරත්වය මතුවන අයුරින් නිරූපිතය.
- කාන්තා රූප එකිනෙක වෙනස් ආකාරයකින් දක්වා තිබීම.
- කාන්තා රූප තනි සහ යුගල ලෙස සංරචනය කර තිබේ.
- මෙම කාන්තා රූප පාර්ශව දර්ශී සහ අර්ධ පාර්ශව දර්ශී ලෙස නිරූපණය කර තිබීම.
- කාන්තා රූපවල ඉරියව් විවිධත්වයක් දැකිය හැකිය. ඒවා තරුණ කාන්තා රූප මැදිවියේ කාන්තා රූප මහලු වියට ආසන්න කාන්තා රූප ලෙස විවිධත්වයෙන් යුක්තය.
- කාව්‍ය සමයේ එන කාන්තා ලාලිත්‍යයට අදාළ ලක්ෂණ මතුකර තිබේ.
- කාන්තා රූපයන් හි පුන් පියයුරු. දේදුනු ඇහිබැම, මීනාක්ෂි, නා දළුවන් දෙතොල්, දිගැටි ගෙල, වටකුරු දෙවුර, සිහින් අතැඟිලි, නළලත තිලකය. පුළුල් උකුල ඉතාමත් අලංකාරව දක්වා තිබේ.
- කාන්තා රූප රන්වන් පැහැයෙන් හා අඳුරු පැහැයෙන් චිත්‍රණය කර ඇත.
- මෙම චිත්‍රවල කාන්තා රූපයන්හි භාව ප්‍රකාශනයේ ද විවිධත්වයක් පවතී.
- මෙම චිත්‍රවල කාන්තාවන්ගේ මුහුණු තුළින් දොම්නස, සොම්නස, ඒ අතරමැදි අවස්ථාවන් මෙන්ම ඇතැම් රූපවල දෙනෙත්වල කාන්තිය, දෙතොලග සිනහව ද දක්වා තිබේ.
- හිසෙහිද මල් ගවසා අලංකාර කර තිබේ. එලෙසම නොයෙකුත් අලංකරණ ආභරණ යොදා තිබේ.
- කර්ණාභරණ, ග්‍රීවාභරණ, හස්තාභරණ හා ඇඳුම් විවිධත්වයකින් යුතුව යොදා ඇත.

**(ලකුණු 05 යි)**



Department of Examinations - Sri Lanka

(iii)

- පොළොන්නරු යුගයට අයත් සිතුවම් වලින් වැඩි ප්‍රමාණයක් දක්නට ලැබෙන්නේ තිවංක පිළිම ගෙයි තුළ ය.
- මහියංගන ධාතු ගර්භය තුළ දැනට සිතුවම් කුඩා ප්‍රමාණයක් ඉතිරිව තිබේ.
- මහියංගන ධාතු ගර්භයේ සිතුවම් ක්‍රි.ව 9 - 11 සියවස් වලට අයත් වන අතර තිවංක පිළිමගෙයි සිතුවම් ක්‍රි.ව 12 වන සියවසට අයත් යැයි සැළකේ.
- තිවංක පිළිමගෙහි, ගර්භගෘහය හා අන්තරාලය යන කොටස් තුළ වඩාත් පැරණිම සිතුවම් දක්නට ලැබෙයි. එහි ගර්භගෘහයේ "බුදුන් වහන්සේ සංකස්ස පුරයට වැඩම කරන දර්ශනය" හා අන්තරාලය කොටසේ "දේවාරාධනය" සිතුවම් දක්නට ලැබේ.
- මහියංගන ධාතු ගර්භයේ "බෝධි වෘක්ෂයක් යට වැඩ සිටින බුදුන් වහන්සේ" දැක්වෙන සිතුවමක් ද "විෂ්ණු දෙවියන්" දැක්වෙන සිතුවමක් ද දක්නට ලැබේ.
- මෙම ස්ථාන දෙකෙහිම සිතුවම් මහා සංරචන ලෙස කළ සිතුවම් වේ.
- තිවංක පිළිමගෙහි දේවාරාධනය සිතුවමේ දෙවිවරුන් වන්දනා කරන ඉරියව් පේළි වශයෙන් සංරචනය කර තිබේ. මහියංගන ධාතු ගර්භයේ විෂ්ණු දෙවියන්ව දැක්වීමේදී අත් සතරක් යොදා තිබේ. එලෙසම බෙහෙවින් ලාලිත්‍යමය ඉරියව් වලින් යුක්තව මෙම ස්ථාන දෙකෙහිම රූප සංරචනය කර ඇත.
- තිවංක පිළිමගෙහි බුදුන් සංකස්ස නුවරට වැඩම කරන සිතුවමෙහි බුදුන් වහන්සේ ත්‍රිභංග ඉරියව්වෙන් දක්වා ඇති අතර මහියංගන ධාතු ගර්භයෙහි ඇති රූපය හිඳි ඉරියව්වෙන් නිර්මාණය කර තිබේ.
- මහියංගන ධාතු ගර්භයේ බුදුන් වහන්සේ වටා අලංකාර රැස් මාලාවක් යොදාගෙන තිබේ. තවද පිටුපසින් බෝ ගසක් ද යොදාගෙන තිබේ.
- තිවංක පිළිමගෙයි සිතුවම් අතර දක්නට ලැබෙන දේව රූපවල මෙන්ම බුදුන් වහන්සේගේ මුහුණින් ශාන්ත බව, කරුණාව නිරූපණය වේ. මහියංගන ධාතු ගර්භයේ බුද්ධ රූපය මඳ සිනහවෙන් සහ ඒකාංශ පාරුපණයෙන් යුක්තය.
- රතු, කහ, ගුරු, නිල්, කළු යන කේන්ද්‍රීය උණුසුම් වර්ණ මාලාවක් මහියංගන ධාතු ගර්භයේ සිතුවම් වල දැක්වෙන අතරම තිවංක පිළිමගෙහි සිතුවම්වල රේඛාව කේන්ද්‍රව රතු, කහ, ගුරු, කළු මිශ්‍ර උණුසුම් ලක්ෂණ මතුකර ඇත්තේ රේඛාව ඇසුරෙනි.
- රේඛාව රිද්මයානුකූල ස්වරූපයෙන් දක්වා තිබේ.

**(ලකුණු 08 යි)**

Department of Examinations - Sri Lanka

**2.** පොළොන්නරු යුගයේ බෞද්ධාගමික ගොඩනැගිලි ඉදිකිරීමේ දී එක්වූ හින්දු ආගමික වාස්තු විද්‍යා ලක්ෂණ ගම්පොළ සහ මහනුවර යුගවලදී ද එලෙසින්ම දක්නට ලැබිණ.

(i) පොළොන්නරු යුගයේ දී ගෙඩිගේ සම්ප්‍රදායට අනුව ගඩොළින් ඉදිවූ බෞද්ධාගමික වාස්තු විද්‍යා නිර්මාණ දෙකක් නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) අංක 2 ශිව දේවාලයේ දක්නට ලැබෙන හින්දු ආගමික වාස්තු විද්‍යා ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

(iii) ගම්පොළ යුගයේ ඉදිවූ ගඩලාදෙනිය විහාරයෙහි හින්දු වාස්තු විද්‍යා ලක්ෂණ බෞද්ධාගමික මුහුණුවරකින් යොදාගෙන ඇති ආකාරය පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 8 යි.)

2.

(i)

- තිවංක පිළිමගෙය
- ථූපාරාම පිළිමගෙය
- ලංකාතිලක පිළිමගෙය

**(ලකුණු 02 යි)**

(ii)

- ශිව දේවාලය අංක (02) පොළොන්නරු යුගයට අයත් පැරණිම හින්දු ස්මාරකයයි.
- ක්‍රි.ව 11වන සියවසේදී රාජරාජ නම් චෝල රජු සිය බිසව සිහිවීම පිණිස මෙය කරවා ඇත.
- අද වන විට ද නොනැසී ආරක්ෂා වී පවතින මෙම ගොඩනැගිල්ල මුළු මනින්ම කැපූ කළුගලින් නිමවා ඇති කුඩා දෙවොලකි.
- දකුණු ඉන්දිය චෝල ශෛලිය නිර්මාණ ශෛලිය පෙන්නුම් කරයි.
- සුවිශේෂී වාස්තු විද්‍යා ලක්ෂණ ලෙස
    - ➢ කුඩු හෙවත් මුදුන් සහිත කවුළු
    - ➢ පැන්නුම් කුලුණු සහ දේව රූප සහිත විමාන
    - ➢ පද්ම බොරදම්
    - ➢ අටපට්ටම් ශිඛරය
    - ➢ ඉදිරි දොරටුවෙහි කැටයමින් යුතු ගල් කුලුන අෂ්ටාශ්‍ර
- කුඩා ගල් උළුවස්ස සහිත ඉදිරි දොරටුව උසින් අඩුවේ.
- ගර්භගෘහය තුළ ශිව ආකෘතිය ලිංග තැන්පත් කර ඇත.
- මණ්ඩපය, අන්තරාලය, ගර්භගෘහයන් යන සම්මත හින්දු දේවාල අංග වලින් සමන්විතය.
- බදාම අවම වශයෙන් භාවිතා කර ඇත.

**(ලකුණු 05 යි)**

Department of Examinations - Sri Lanka

(iii)

- ගම්පොළ යුගයේ ගඩලාදෙණි විහාරය සුවිශේෂී බෞද්ධාගමික විහාරස්ථානයකි.
- ගම්පොළ රජ කළ හතර බුවනෙකබාහු රජ සමයේ මෙය නිර්මිත ය.
- දකුණු ඉන්දීය ශිල්පියෙකු වන ගනේෂ්වරාචාර්ය මෙහි නිර්මාණ ශිල්පියා වේ.
- ගෙඩිගේ සම්ප්‍රදායට ඉදිකර ඇති මෙහි පියස්ස ශිඛරමය හැඩයක් දක්නට ලැබෙන අතර බෞද්ධ මුහුණුවරක් එයට ලබා දීමට, එම ශිඛරය චෛත්‍යයක හැඩයට නිර්මාණය කරන ලදී.
- මණ්ඩපය, අන්තරාලය, ගර්භගෘහය යන හින්දු දේවාල වල අංග සහිතව ඉදිකළ ද මෙහි ඇතුළත හිඳි බුද්ධ රූප ද හිටි බුද්ධ ප්‍රතිමා සතරක් ද දක්නට ලැබේ. ඒවා තුළින් බෞද්ධ මුහුණුවරක් මෙම නිර්මාණයට ශිල්පියා ලබා දී තිබේ.
- ඇතුළත බිත්ති මත බෞද්ධ ආගමික සිතුවම් ද දැකගත හැකිය.
- ගඩලාදෙනි විහාරයේ ඉදිරිපස දොරටුව නිර්මාණයේ දී සාම්ප්‍රදායික බෞද්ධ ගෘහ නිර්මාණ අංග වන සඳකඩපහන, මුරගල, කොරවක් ගල් දැකගත හැකිය.
- කොරවක්ගල් සඳහා ගජසිංහ රූපයොදා ඇත.
- ගඩලාදෙණි විහාරයට බෞද්ධ මුහුණුවරක් ලබා දීමට විහාරය ආසන්නයේ විජයොත්පාය නම් බෞද්ධාගමික නිර්මාණය ඉදිකර ඇත.
- කොරවක්ගල් සඳහා ගජසිංහ රූපය යොදා ඇත.
- කුලුනු පාදම් සිංහ රූප වලින් සමන්විතය.

**(ලකුණු 08 යි)**

3. යුරෝපයේ නූතනවාදී කලා ප්‍රවණතා ගුරුකොට ගනිමින්, විසිවැනි සියවස මැද භාගයේ බිහි වූ ශ්‍රී ලාංකීය චිත්‍ර හා මූර්ති ශිල්පීන් විසින් යුග මෙහෙවරක් ඉටු කරනු ලැබ ඇත.
   (i) නූතනවාදී මූර්ති කලාවේ ශිල්ප ක්‍රම භාවිත කරමින් තිස්ස රණසිංහ විසින් නිම කරන ලද මූර්ති දෙකක් නම් කරන්න. (ලකුණු 2 යි.)
   (ii) ස්ටැන්ලි අබේසිංහ චිත්‍ර ශිල්පියාගේ සිතුවම් ශෛලිය පිළිබඳව ඔහුගේ කෘති ඇසුරු කරගනිමින් කෙටි ඇගයීමක් කරන්න. (ලකුණු 5 යි.)
   (iii) 43 කණ්ඩායමේ ප්‍රමුඛතම චිත්‍ර ශිල්පියෙකු වූ අයිවන් පීරිස්ගේ 'ආපසු ඒම' සහ 'ගල්කිස්ස' යන සිතුවම් ඇසුරින් ඔහුගේ කෘතීන්හි දිස්වන බටහිර නූතන චිත්‍ර කලා ප්‍රවණතා පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 8 යි.)

(i)

- දුෂ්කර ක්‍රියාව මූර්තිය
- මහීෂගේ මරණය
- මොණරා පිට ගමන් කරන්නා
- මුහුණු දෙක
- බුද්ධි ප්‍රබෝධය
- ගොබිරිල්ලා
- භගීරථගේ දුෂ්කර ක්‍රියාව

**(ලකුණු 02 යි)**



Department of Examinations - Sri Lanka

(ii)

- ස්ටැන්ලි අබේසිංහ ශ්‍රී ලාංකේය නූතන චිත්‍ර කලාවේ පුරෝගාමී සිත්තරෙකි.
- මොහුගේ විශේෂිත කෘති ලෙස "කිදුරියගේ නැටුම" "තාරුණ්‍ය හා බෙලහීනත්වය" "ඇසළ පෙරහැර" "කුඹල් හළ" දැක්විය හැක.
- "කිදුරියගේ නැටුම" සිතුවම මගින් දේශීය කලාවේ සාම්ප්‍රදායික ලක්ෂණ සහ යුරෝපීය නූතන වාදී කලා ලක්ෂණ වන පශ්චාත් උපස්ථිතිවාදී (Expressionism) සහ වනමෘගවාදී (Fauvism) ලක්ෂණ ආභාසය කරගනිමින් මෙම සිතුවම නිර්මාණය කර තිබේ.
- ඇසට පෙනෙන ස්වභාවික ලක්ෂණ වෙනස්කම් වලට ලක්කර ඇත.
- පර්යාවලෝකන ලක්ෂණ භාවිත කර නොමැත.
- "තාරුණ්‍ය හා බෙලහීනත්වය" සිතුවම මගින් ද නූතනවාදී කලා ලක්ෂණ නිරූපණය වේ.
- මෙහි එක් ප්‍රධාන උපක්‍රමයක් ලෙස ස්වභාවිකත්වය විකෘති කිරීම මගින් චිත්‍රයේ ප්‍රකාශනාත්මක බව මතුකර ඇත.
- ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී (Academic Realism) කලාවේ ලක්ෂණ වන පසුබිම හා පෙරබිම මෙම චිත්‍රය සැලසුම් කිරීමේ දී යොදාගෙන නොමැත.
- අවකාශය තුළ ඇති හැඩවල පවතින නිශ්චිත බව මෙම චිත්‍රයේ අවධාරණය කර නොමැත.
- මෙම නිර්මාණය සඳහා උපස්ථිති වාදී, පශ්චාත් උපස්ථිතිවාදී හා ජර්මානු ප්‍රකාශනවාදී කලා ලක්ෂණයන්ගේ ආභාසය ලැබී තිබේ.

(ලකුණු 05 යි)

(ii)

- 43 කණ්ඩායම සමග ගොඩනැගුණු තනි පුද්ගල ශෛලියකි.
- ඔහුගේ චිත්‍රමය භාෂාව ඉතාමත් සරල වූ අතර සිරස් හා තිරස් ආකෘතියක් මත චිත්‍ර සංරචනය කර තිබේ.
- පියේ මොන්ඩ්‍රියාන් ගේ සංවිධිත කොටු දැල් ආකෘති සිහි ගන්වයි.
- සිතුවම් තුළ සියුම් සහ තද නිහඬ ප්‍රකාශනයක් ගොඩ නගයි.
- බොහෝවිට සිතුවම් ඒකවාර්ණික (Monochrome) ලක්ෂණ පෙන්නුම් කරයි.
- "ආපසු ඒම" හා "ගල්කිස්ස" නම් සිතුවම් මොහුගේ සුවිශේෂී නිර්මාණ වේ.

**ආපසු ඒම**

- සිතුවම කැන්වසය මත තෙල් සායමෙන් ඇඳ තිබේ.
- සියලුම හැඩතලයන්ගේ විස්තර අවම කර ඇත.
- යුරෝපීය නූතන කලාවේ කොටු දැල් ආකෘතිය (Grid form) දැකිය හැකිය.
- සාමාන්‍ය මානව රූපයක ඇති පරිමාණය ඉක්ම වූ නිසා වියුක්ත රූපී ලක්ෂණ දෙසට යොමු වී ඇත.
- රේඛා භාවිතයෙන් මුළුමනින්ම තොරය.

- එළිය හා අඳුරු හැඩතල හැසිරවීමෙන් මතුවන රටාමය ලක්ෂණය චිත්‍රයේ රචනාමය බවට හේතු වී ඇත.
- මොන්ඩ්‍රියාන්ගේ ඝණිකවාදී ලක්ෂණ සිතුවම්වල ආභාසය මෙන්ම එල්.ග්‍රෙකෝ ගේ රූපික ලක්ෂණ ද දැකිය හැකිය.
- වස්තූන්ගේ ගති ස්වභාවයන් දක්වා නැත. අවමය යොදා ගනිමින් උපරිමය ප්‍රකාශයට පත් කිරීම මෙම නිරූපණ ශෛලියේ හරය ලෙස දැකිය හැකිය.

**ගල්කිස්ස**

- මෙම සිතුවම කැන්වසය මත තෙල් සායමින් නිමකර ඇත.
- ඝන හා නිසල බවින් යුක්ත ය.
- ස්වභාවික හැඩ ඊට ආවේනික ස්වභාවය වියුක්ත කර, සරල බවකින් ඉදිරිපත් කර ඇත.
- එතෙක් පැවති ස්වභාවික නිරූපණ ක්‍රමවේද බැහැර කර තිබේ.
- ජ්‍යාමිතික ආකෘතියක් මත මෙම සංරචනය කර ඇත.
- ශ්‍රී ලාංකේය නූතනවාදී චිත්‍ර කලාවේ ප්‍රකාශනවාදී ලක්ෂණ සහිත චිත්‍රයකට කදිම නිදසුනක් ලෙස මෙම සිතුවම දැක්විය හැකිය.
- නූතනවාදී චිත්‍ර කලාවේ පවතින විධිමත් තාර්කික ආකෘතිමය ලක්ෂණ ද මෙම සිතුවමෙහි දැක්වේ.
- ඝණිකවාදී කලාවේ ආකෘතිය පිළිබිඹු වේ.

(ලකුණු 08 යි)

'ආ' කොටස
(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

4. මෞර්ය වංශික ධර්මාශෝක රජුගේ පාලන සමයේදී ආරම්භ වූ බෞද්ධ කලා සම්ප්‍රදාය ගුප්ත යුගය අවසානය දක්වා පැවැතියේ ය.

(i) අශෝක ස්ථම්භ **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) සාංචි ස්තූපයේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳව කෙටි පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 5 යි.)

(iii) "අජන්තා බිතු සිතුවම් අතර ථෙරවාදී සහ මහායාන සම්ප්‍රදායන් දෙකටම අයත් සිතුවම් දක්නට ලැබේ." සංසන්දනාත්මකව විමසන්න. (ලකුණු 8 යි.)

4. (i)

- ලෞරියා නන්දනගර් ස්ථම්භය
- රුම්න්දෙයි ස්ථම්භය
- බෂාර් මබීරා ස්ථම්භය
- රාම්පූර්වා ස්ථම්භ ශීර්ෂය
- සාරානාත් ස්ථම්භ ශීර්ෂය
- සාංචි ස්ථම්භ ශීර්ෂය
- ලෞරියා අරරාජ් ස්ථම්භය



Department of Examinations - Sri Lanka

- දිල්ලි තෝප්රා ස්ථම්භය
- දිල්ලි මිරාට් ස්ථම්භය
- සංකස්ස ස්ථම්භය
- නිග්ලීව ස්ථම්භය
- කොල්හුවා ස්ථම්භය

(ලකුණු 02 යි)

(ii)

- සාංචි ස්තූපය ක්‍රි.පූ 3වන සියවසේ දී අශෝක රජතුමා විසින් කරවන ලද බව සඳහන් වේ.
- බුබ්බුලාකාර හැඩයකින් යුතු මෙම ස්තූපය අඩි 120 විශ්කම්භයකින් යුතුය. උස අඩි 56කි.
- ලංකාවේ ස්තූපයේ මෙන් මෙහි පේසා වළලු දක්නට නොලැබේ. ඒ වෙනුවට ඇත්තේ මේධිය නමින් ගැනෙන පේසාවකි. මෙය ප්‍රදක්ෂිණා පථ ලෙසින් ද හැඳින් වේ.
- මෙම ස්තූපයේ ප්‍රදක්ෂිණා පථ දෙකකි. එකක් පොළොව මට්ටමේ පිහිටා ඇති අතර අනෙක් ප්‍රදක්ෂණා පථය පොළොව මට්ටමේ සිට අඩි 16 ඉහළින් ස්තූපයට සම්බන්ධ කර නිර්මාණය කර ඇත.
- ගර්භයට ඉහළින් පිහිටා ඇති ගල් ගරාදි වැටකින් යුත් හතරැස් කොටුව හර්මිකා නම් වේ.
- එහි මධ්‍යයේ සිටුවන ලද යූප හෙවත් සෙල්මුවා ටැඹෙහි ඉහළ සිට පහළට ක්‍රමයෙන් විශාලවන සේ සවිකරන ලද ඡත්‍ර තුනක් දක්නට ලැබේ.
- ඡත්‍ර නිර්මාණය වී ඇත්තේ වෘත්තාකාර ගල් පුවරු තුනක් යෂ්ටිය මත සවි කිරීමෙනි.
- ඉහළ ප්‍රදක්ෂිණා පථයට නැගීමට දෙපැත්තෙන් පඩිපේළි දෙකක් නිර්මාණය කර ඇත.
- සිව් දිසාවෙහි ගලින් කරන ලද තොරණ් සතරක් පිහිටා ඇත.
- අශෝක රජතුමා විසින් මෙම ස්තූපය මුලින්ම ගඩොළින් ගොඩනගා, එය වටා කලාත්මක ලී වැටක් කරන්නට ඇතැයි සැලකේ.
- පසුව නැවතත් ස්තූපය විශාලකර බඳවා ඇත.
- දැනට ඇති තොරණ සහ ගල්වැට සුංග යුගයේ දී ආන්ධ්‍රයින් විසින් නිර්මාණය කරන්නට ඇතැයි සැලකේ.

(ලකුණු 05 යි)

(iii)

- අජන්තා ගුහා, ඒවා අයත් කාල පරාසයන් අනුව මහායාන ලෙන් හා ථේරවාද ලෙන් යනුවෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.
- මුල් යුගයේ නිර්මාණය වූ ලෙන් ථේරවාද ලෙන් ලෙස ද ක්‍රි.ව. 450න් පසුව ඉදි වූ ලෙන් මහායාන ලෙන් ලෙස ද සැලකේ.
- අංක 9 සහ 10 දරණ ගුහා අජන්තාවේ ඇති පැරණිම ගුහා ලෙස සැලකෙන අතර එහි දක්නට ලැබෙන සිතුවම් ථේරවාදී ලක්ෂණ පෙන්නුම්කරණ බවත් කියවේ.

Department of Examinations - Sri Lanka

- **අංක 9 ගුහාවේ ඇති චිත්‍ර**
  - පිරිවර සමග සිටින නා රජු
  - උපාසක උපාසිකාවන් පිරිවරාගත් බුදුන්වහන්සේ
  - දාගැබ සහිත විහාරය
  - පිරිවර සමග බෝධිය වැඳීමට යන කුමරු
  - තූර්ය භාණ්ඩ වාදනය කරන ස්ත්‍රීන්
- **අංක 10 ගුහාවේ ඇති චිත්‍ර**
  - ඡද්දන්ත ජාතකය, සාම ජාතකය
  - බෝධියට පූජා පවත්වන රජු සහ පිරිස
  - මෙහි ඇති සාම ජාතකයේ බරණැස් රජතුමාගේ හිසබැඳි ජටාව
  - සාංචි භාරුත් කැටයම්වල ඇති ජටාවලට සමාන බව පර්සි බ්‍රවුන් මහතා සඳහන්කර ඇත.
- අංක 1,2,16,17 දරන ගුහා මහායාන සම්ප්‍රදායට අයත් සිතුවම් දක්නට ලැබෙන ගුහා ලෙස සැලකේ.

- **අංක 1 දරණ ගුහාවේ ඇති චිත්‍ර**
  - පද්මපානී බෝසත් රුව, අවලෝකිතේශ්වර බෝසත් රුව මහායාන සම්ප්‍රදායේ සිතුවම් සඳහා හොඳම නිදසුන් වේ.
  - මහා හංස,
  - මහාජනක
  - චම්පෙය්‍යය යන ජාතක කතා
  - බෝසතුන්ගේ ගිහි ජීවිතය දැක්වෙන චිත්‍ර
  - මාර යුද්ධය
  - චාලුක්‍ය රජු බැහැදැකීමට පැමිණි පර්සියන් තානාපති පිරිස

- **අංක 2 ගුහාවේ ඇති චිත්‍ර**
  - බෝධි සත්වෝත්පත්තිය
  - කුලුණකට හේත්තු වී සිටින කුමරිය
  - නිළියකට දඬුවම් පැමිණීමට සැරසෙන රජු
  - විධුර ජාතකය.

- **අංක 16 ගුහාවේ ඇති චිත්‍ර**
  - මරණාසන්න කුමරිය
  - ඇත්පොරය
  - බුදුරජාණන් වහන්සේ දහම් දෙසන අයුරු දැක්වෙන චිත්‍රය
  - බුද්ධ චරිතයේ අවස්ථා දැක්වෙන චිත්‍ර



Department of Examinations - Sri Lanka

- අංක 16 ගුහාවේ ඇති චිත්‍ර අතර
    - ➤ කිඹුල්වත්පුර පිඩුසිඟා වැඩීම
    - ➤ විජය රජුගේ ලංකා ගමනය
    - ➤ වලාහත්ථි ජාතකය
    - ➤ අප්සරා රුව
    - ➤ ඡද්දන්ත ජාතකය
    - ➤ ස්වර්ණ හංස ජාතකය
    - ➤ වෙස්සන්තර ජාතකය
    - ➤ මාතුපෝසක ජාතකය
    - ➤ සංකස්සපුර දේවාරෝහණය යන බිතුසිතුවම් වැදගත් වේ.
    - ➤ මහායාන ලෙන්වල මානව රූප කලාත්මකව ඇඳ ඇත.
    - ➤ කාන්තා සහ පිරිමි රූ තේමාවන්ට අනුව මනාව සම්පිණ්ඩණය කරමින් අර්ථ ප්‍රකාශනයේ යෙදීමට ශිල්පියා සමත් වී ඇත.
    - ➤ ඉන්දීය සිතුවම් තුළ දක්නට ලැබෙන ශඩංග භාවිතය මහායාන ලෙන් තුළ ඇඳ ඇති සිතුවම් තුළින් දිස්වේ.

**(ලකුණු 08 යි)**

5. ඉන්දීය බෞද්ධ කලා සම්ප්‍රදායන් අතර ප්‍රතිමා නිර්මාණකරණයේ වෙනස්කම් රැසක් දක්නට ලැබේ.
   (i) ගාන්ධාර කලා සම්ප්‍රදායට අනුව නිම කළ පිළිම දෙකක් නම් කරන්න. (ලකුණු 2 යි.)
   (ii) මථුරා සම්ප්‍රදායට අයත් කත්‍රා බුදු පිළිමය ගැන කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 යි.)
   (iii) ගුප්ත යුගයට අයත් මථුරා බුදු පිළිමයේත් සාරනාත් බුදු පිළිමයේත් දක්නට ලැබෙන කලා ලක්ෂණ සංසන්දනාත්මකව විග්‍රහ කරන්න. (ලකුණු 8 යි.)

5. (i)

- සහරි බහ්ලොල් ප්‍රතිමාව
- තක්තිබහීර් ප්‍රතිමාව
- හෝටිමන්දාර් ප්‍රතිමාව
- බ්‍රෙගම් ප්‍රතිමාව
- දුෂ්කර ක්‍රියාව දක්වා ප්‍රතිමාව

**(ලකුණු 02 යි)**

(ii)

- මථුරාවෙහි කත්‍රානම් ස්ථානයෙන් හමුවූ බුද්ධ ප්‍රතිමාවකි.
- සිංහරූප තුනක් සහිත ආසනයක්මත වැඩ සිටින ලෙසින් නෙලා ඇත.
- දකුණතින් අභය මුද්‍රාව නිරූපණයකර ඇති අතර පද්මාසන ක්‍රමයට දෙපා තබාගෙන ඇත.
- වමත වම් පාදය මත සෘජුව තබා සිටී.
- එක් උරයක් වැසෙන සේ ඇඟට ඇලී ගිය චීවරයේ රැළි රේඛාවෙන් මතුකර ඇත.
- මුහුණින් කරුණාබර සොම්නස් සහගත බවක් පිළිබිඹු වේ.



Department of Examinations - Sri Lanka

- හිස වටා චාම් ප්‍රභා මණ්ඩලයකි. බුදුරුව දෙපස ඉන්ද්‍ර හා බ්‍රහ්ම දේව රූප දෙකක් දැක්වේ.
- පිටුපසින් බෝධිය හා ඉහළින් දේවතා රූප දෙකක් ද කැටයම් කර ඇත.
- මේ හා සමාන ප්‍රතිමා කිහිපයක් කත්‍රා නම් ස්ථානයේ සොයාගෙන ඇති අතර එක් ප්‍රතිමාවක සිංහ රූප දෙකක් සහ වැඳගෙන සිටිනා ලෙසින් මිනිස් රූප දෙකක් ආසනයෙහි කැටයම් කර ඇත.

**(ලකුණු 05 යි)**

**(iii) මථුරා හිටි පිළිමය**

- ගුප්ත යුගයේ දී නිර්මාණය වී ඇති මෙම ප්‍රතිමාව මථුරා ගුරුකුලයෙන් බිහි වූ අග්‍රඵලය සේ සැලකේ.
- රතු වැලි ගලින් නිර්මාණය කර ඇති මෙම ප්‍රතිමාව ඉතා සුන්දර චමත්කාර ජනක කඩවසම් දේහ ලක්ෂණවලින් යුක්තය.
- උෂ්ණීෂය සහිතව කුණ්ඩලාකාර හිසකේ ඉතා සියුම් ව දක්වා ඇත.
- අඩවන් දෙනෙත්, මද සිනහව ලඹ සවන් ආදිය මගින් බුදුරාජාණන් වහන්සේගේ අධ්‍යාත්මික ගුණ මතුකර ඇත.
- දෙවුර වැසෙන සේ ඇඟට ඇළුණු අයුරින් වන චීවරයේ රැළි රිද්මයානුකූලව දක්වා ඇත.
- පිරිපුන් ශරීරයේ හැඩය මැනවින් ඉස්මතු වේ.
- වමත පහළ හෙලා දකුණත වැලමිටෙන් ඉදිරියට නවා ඇත.
- නෙළුම් පෙති ලියවැල් ආදියෙන් යුතු අලංකාර සියුම් කැටයම් සහිත ප්‍රභාමණ්ඩලයකි.

**සාරානාත් පිළිමය**

- ගුප්ත කලා සම්ප්‍රදායේ සාරානාත් ගුරුකුලයෙන් බිහි වූ ඉන්දීය බුදු පිළිම අතර අග්‍රගණ්‍ය නිර්මාණයකි.
- චුනාර් නැමැති පාෂාණයෙන් නිමවා ඇත.
- පද්මාසන ක්‍රමයෙන් වැඩ සිටින අතර දෑතින් ධර්මචක්‍ර මුද්‍රාව දැක්වේ.
- බරණැස ඉසිපතන මිගදායේ දී බුදුරදුන් පස්වග මහණුන්ට දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කිරීම නිරූපිත යැයි සැලකේ.
- දේදුනු ඇහිබැම පිරිපුන් දෙතොල් ලඹ සවන් ආදියෙන් යුතු අණ්ඩාකාර මුහුණ ප්‍රසන්න තරුණ බවකින් යුක්ත ය.
- බුදුන් වහන්සේගේ උපශාන්ත බව, මහා කරුණා ගුණය අසමසම පෞරුෂය මතුකර ඇත.
- දෙවුර වැසෙන සේ පොරවා ඇති චීවරය ඇඟට ඇළුණු ස්වභාවයෙන් දක්වා ඇත. චීවරයේ රැළි නොදැක්වේ.
- සිවුර තුළින් ශරීර හැඩය මනාව මතුවෙතත්, මාංශ පේශීන් ඉස්මතු නොවන සේ සරලව කඩවසම්ව නෙලා ඇත.
- සම්මත මිනුම් ක්‍රම අනුව පරිමාණුකූලව නිර්මාණය කර ඇත.
- ඉතා සියුම්ව කැටයම් කළ අලංකාර ලියවැල් සහිත ප්‍රභා මණ්ඩලයකි.
- වැඩ හිඳින ආසනයේ ඉදිරිපස මැද ධර්ම චක්‍රයකි. දෙපස වැඳ සිටින ශ්‍රමණ රූප හයකි.
- මිගදාය සිහිපත් කිරීමට මුවන් දෙදෙනෙකු දක්වා ඇත.

**(ලකුණු 08 යි)**



Department of Examinations - Sri Lanka

## 'ඉ' කොටස
## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

**6.** 'අධියථාර්ථවාදය' (surrealism) යනු විසිවැනි සියවසේ චිත්‍ර කලාව නව මගකට යොමු කළ ප්‍රවණතාවකි.

(i) අධියථාර්ථවාදී චිත්‍ර ශිල්පීන් දෙදෙනකු නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) අධියථාර්ථවාදී කලාවේ මූලික ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

(iii) අධියථාර්ථවාදය, යථාර්ථවාදී කලාවෙන් මෙන්ම වියුක්ත කලාවෙන් ද වෙනස් වන ආකාරය 'තොම්යෙන මතකය' චිත්‍රය ඇසුරින් විමසන්න. (ලකුණු 8 යි.)

6. (i)

- සැල්වදෝර් ඩාලි (Salvador Dali) (1904 - 1984)
- ෆ්‍රිඩා කාලෝ (Freda Karlo) (1907 - 1954)
- ජෝන් මිරෝ (JOAN MIRO)
- රෙනේමැග්‍රිට් (RENE MAGRIT)

(ලකුණු 02 යි)

(ii)

- 20 වැනි සියවසේ මුල් භාගයේ දී ප්‍රභවය ලැබූ වැදගත් කලා ව්‍යාපාරයකි.
- පළමු ලෝක යුද්ධයෙන් පසුව ඇති වූ අප්‍රසන්න අත්දැකීම් මේ සඳහා පසුබිම සපයා ඇත.
- සිග්මන්ඩ් ප්‍රොයිඩ් ගේ මනෝ විශ්ලේෂණ සංකල්ප වන, අවිඥාණිකත්වය සහ සිහින විශ්ලේෂය පදනම් කරගෙන ඇත
- අභව්‍යත්වය, ලිංගිකත්වය, අතාර්තිකත්වය, ස්වයං ආත්ම විවරණය ආදිය කලාත්මක තේමා සඳහා යොදාගෙන ඇත.
- සාමාන්‍ය යථාර්තයෙන් ඔබ්බට ගිය සිහිනමය, මායාකාරී, රූපක ගොඩනැගීම දැකගත හැකි ය.
- කලාත්මක රූප ගොඩනැගීමට බාහිර ලෝකයට වඩා සිත අභ්‍යන්තරයේ හටගන්නා මනෝභාව වැදගත් බව අධි යථාර්තවාදී කලාකරුවෝ තරයේ විශ්වාස කළහ.

(ලකුණු 05 යි)

(iii)

**යථාර්තවාදය**

- යථා ලෝකයේ දැක්වෙන වස්තු විෂය ඒ අයුරින්ම නිවැරදිව හා තථ්‍යවාදීව නිරූපණය කිරීම යථාර්ථවාදයෙන් සිදු කෙරේ.
- යථාර්ථවාදය තුළ චිත්‍ර කලා මූලිකාංග / මූලධර්ම තථ්‍ය ස්වරූපයෙන් භාවිත කරයි.



Department of Examinations - Sri Lanka

**වියුක්තවාදය**

- වියුක්ත කලාව යන්නෙහි දළ අදහස වන්නේ හඳුනාගත හැකි රූපයකින් තොර යන්නයි.
- ස්වභාවධර්මය හෝ එහි වස්තූන් ඒ ආකාරයෙන්ම අනුකරණය කිරීමත් නැවත ප්‍රතිනිර්මාණය කිරීමත් අතහැර දැමීම සිදු කරයි.

යථාර්තවාදී කලාවෙහි යථාලෝකයෙහි පවතින වස්තු විෂය තත්වාකාරයෙන්ම දැක්වේ. වියුක්ත කලාවෙහි ස්වභාව ධර්මය හෝ එහි වස්තූන් අනුකරණය හෝ ප්‍රතිනිර්මාණය නොකරයි. අධියථාර්තවාදී කලාවෙහි යථාර්තවාදී රූප ඇසුරින් සාමාන්‍ය ලෝකයට වෙනස් සිහිනමය ලෝකයක් නිරූපණය වේ.

යථාර්තවාදීන් වඩාත් නිවරදි ලෙස චිත්‍රකලා මූලිකාංග සහ මූලධර්ම භාවිතා කරයි. වියුක්ත වාදීන් ඉහත සිද්ධාන්තයන්ගෙන් බැහැර වී සරලකරණය හා වියුක්තකරණය මගින් සිදු කරයි. අධියථාර්තවාදී කලාවෙහි එම මූලිකාංග සහ මූලධර්ම චිත්‍ර ශිල්පියාට අවශ්‍ය පරිදි තේමාව ප්‍රකාශ කිරීම සඳහා හේතුඵල සම්බන්ධතාවයෙන් තොරව යොදාගත හැකිය.

**(ලකුණු 08 යි)**

7. පුරාතන සමයේ බලවත් රාජධානියක් වූ ඊජිප්තුවේ කලා කෘතිවල ඔවුනටම අනන්‍ය වූ සාම්ප්‍රදායික ලක්ෂණ බහුලව දක්නට ලැබිණි.

(i) සාම්ප්‍රදායික ලක්ෂණවලින් සමන්විත ඊජිප්තු මූර්ති **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) ඊජිප්තුවේ මූර්ති තුළ දක්නට ලැබෙන සාම්ප්‍රදායික ලක්ෂණ පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

(iii) සාම්ප්‍රදායික ඊජිප්තු චිත්‍ර කලා ලක්ෂණවලට අනුව 'නාටිකාංගනාවෝ' සහ සංගීතඥයෝ' නමැති සිතුවම සුවිශේෂී නිර්මාණයකි. ඒ බව 'කුරුලු දඩයම' සිතුවම සමග සංසන්දනය කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 8 යි.)

(i)

- මෙන්කුරේ රජු හා ඔහුගේ බිසව
- ස්ක්‍රයිබ්
- නෙනෙර්ටටී
- රැම්සෙස්
- කාෆ්රේ
- රහොටෙප් හා නෝෆ්‍රෙට්
- ටුටන්කාමන්
- ස්ෆින්ක්ස් **(ලකුණු 02 යි)**

(ii)

- ස්වභාවිකවාදී ශෛලිගත ලක්ෂණයන්ගෙන් යුතු වීම.
- ලාලිත්‍යයෙන් හා ක්‍රියාශීලී ඉරියව්වකින් තොර වූ, නිශ්චල දරදඬු ස්වරූපයෙන් ස්වභාවිකව හැඩ නිරූපණය කිරීම.
- ජ්‍යාමිතික හැඩයෙන් යුක්ත වීම.
- සමමිතික ලක්ෂණ වලින් යුක්ත වීම.
- ඉදිරි පාර්ශවීය (ඍජු දර්ශී) ස්වරූපයෙන් යුක්ත වීම.
- හිටි මූර්ති නිරූපණයේ දී වම් පාදය ඉදිරියට තබා සිටින සේ නිර්මාණය කිරීම.
- පුරුෂ රුවේ යටිකය පමණක් ආවරණය වූ කෙටි ඇඳුමකින්, ස්ත්‍රී රූප ඇඟට ඇළුණු වළළු කර දක්වා දිගැටි වස්ත්‍රයන් ද යුතු වීම.
- ආභරණ හා අලංකරණයෙන් තොර චාම් ස්වභාවය
- හැඟීම් විරහිත මුහුණක් සහ විවෘත දෙනෙතින් ඍජුව ඉදිරිය බලා සිටීම. **(ලකුණු 05 යි)**

Department of Examinations - Sri Lanka

(iii)

- කුරුළු දඩයම, නාට්‍යාංගනාවෝ සහ සංගීතඥයෝ යන සිතුවම් ද්විත්වයම ඊජිප්තුවේ නව රාජධානි යුගයට අයත් ය.
- ඊජිප්තුවේ තෙබාමුන් සොහොන් ගැබෙන් මෙම සිතුවම් ද්විත්වයම හමු වී ඇත.
- සිතුවම් ස්වභාවික හා ශෛලිගත ලක්ෂණ විද්‍යමාන කෙරේ.
- පසුබිම සඳහා ඊජිප්තු රූපාක්ෂර යොදාගෙන ඇත.
- කුරුළු දඩයම සිතුවම සඳහා මෙන්ම නාටිකාංගනාවෝ සහ සංගීතඥයෝ සිතුවම් සඳහා ද රාජකීයත්වය හා සම්බන්ධ තේමාවක් වස්තු විෂය වී ඇත.
- අවකාශය පුරා කළ සිතුවම් කිහිපයක් කුරුළු දඩයම සිතුවමේ දැකිය හැකි නමුත් තීරුවක් තුළ කළ සංරචනයක් සංගීතඥයෝ හා නාටිකාංගනාවෝ සිතුවමේ දැකිය හැකිය.
- කුරුළු දඩයම සිතුවමේ ස්වභාවික සත්ත්ව රූප හා ශෛලීගත මානව රූප යොදා ඇත. සංගීතඥයෝ හා නාටිකාංගනාවෝ සිතුවමේ මානව රූප ස්වභාවිකත්වයෙන් හා නම්‍යශීලි ඉරියව් වලින්, චලනමය ලෙස සංරචනය කර ඇත.
- චරිත නිරූපණයේ දී තරාතිරම අනුව මානව රූප අනුප්‍රාප්තිකව විශාලත්වයෙන් කුරුළු දඩයම සිතුවමේ යොදා තිබුණද, සංගීතඥයෝ හා නාටිකාංගනාවෝ සිතුවමේ චරිත සුවිශේෂ කර නොදක්වයි.
- සීමා සහිත ලෙස, ඉවසිලිවන්තව කුරුළු දඩයම සිතුවමෙහි රේඛා භාවිතා කළ ද ඉතා නිදහස් රේඛාකරණයක් සංගීතඥයෝ හා නාටිකාංගනාවෝ සිතුවමේ භාවිත කර ඇත.
- කුරුළු දඩයමේ ශිල්පියා මානව රූව නිරූපණයේ දී මුහුණු හා පාද පැති පෙනුමෙන් ද ශරීරය ඉදිරි පෙනුමෙන් ද ඇඳ ඇත. ශිල්පියා සංගීතඥයෝ හා නාටිකාංගනාවෝ සිතුවමේ ස්වභාවිකත්වයෙන් යුතු ඉදිරි පෙනුමත් මදක් ඉදිරිපස පෙනුමත් ආදී වශයෙන් නිරූපණය කර ඇත.
- පුරුෂ රූපවල උඩුකය නිරුවත්ව දැක්වීමත්, ස්ත්‍රී රූපවල දුහුල් සළුවකින් ඇඟට ඇළව ගිය දිගු ඇඳුමක් යෙදීමත් සාම්ප්‍රදායික ආභරණ වලින් සැරසිලි කිරීමත් කුරුළු දඩයම සිතුවමේ දැකිය හැකිය.
- සංගීතඥයෝ හා නාටිකාංගනාවෝ නිරූපණයේ දී සැරසිලි බහුල ආභරණ හා විවිධ ඇඳුමින් යුතු වීමත් ආභරණ පමණක් පැළඳ සිටින ආකාරයෙන් යුතුව නග්න කාන්තා රූප යෙදීමත් දැකගත හැකිය.
- සිද්ධාන්ත භාවිතයේ දී පරිමාණය, ත්‍රිමාණ ලක්ෂණ, කුරුළු දඩයම සිතුවමේ භාවිත කර ඇති අතර මෙම ලක්ෂණයන් සංගීතඥයෝ හා නාටිකාංගනාවෝ සිතුවමේ ද දැකිය හැකිය.
- සමස්තයක් ලෙස දැක්වීමේ දී කුරුළු දඩයම සිතුවමේ දැකිය හැකි සාම්ප්‍රදායික ලක්ෂණ අතික්‍රමණය කරමින් නව ප්‍රවේශයකින් චිත්‍රණය කිරීමක් සංගීතඥයෝ හා නාටිකාංගනාවෝ සිතුවමින් නිරූපණය වේ.

**(ලකුණු 08 යි)**



Department of Examinations - Sri Lanka

## සැලකිය යුතුයි.

*චිත්‍ර කලාව 11 හා 111 පත්‍ර සඳහා පිළිතුරු සැපයීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් ඔබ වෙත සපයා ඇති අනුහුරු අභ්‍යාස පොත පරිශීලනය කිරීමෙන් ගුණාත්මක ඇගයීමක ප්‍රවේශයක් හා උපදේශනයක් ලබාගත හැකිය. එහි දක්වා ඇති උදාහරණ අනුව ලකුණු ප්‍රදානය කිරීමේ දී නිර්ණායක පදනම් කර ගැනීම අත්‍යාවශ්‍ය වේ.*

### 11. පත්‍රය - නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

අභිමතාර්ථ

1 - ස්වභාවික හා නිර්මිත වස්තූන්ගේ ස්වභාවය හා හැඩය තේරුම් ගැනීමේ හැකියාව හා සිද්ධාන්ත භාවිතය පිළිබඳ කුසලතාව හා ක්‍රමශිල්ප භාවිතය මැන බැලීම.

2 - රේඛා මාධ්‍ය භාවිතයෙන් වස්තූන්ගේ ගති ලක්ෂණ නිරූපණය වන සේ ප්‍රකාශ කිරීමේ හැකියාව හා සම්පිණ්ඩනය කිරීමේ හැකියාව මැන බැලීම.

3 - වර්ණ භාවිත කිරීමේ ක්‍රම ශිල්ප හා වස්තූන්ගේ ගති ලක්ෂණ මතුවන සේ වර්ණ භාවිතය පිළිබඳ හැකියාව මැන බැලීම.

11. වන පත්‍රය සඳහා අපේක්ෂකයන් ඇඳ ඇත්තේ එක් වර්ණ චිත්‍රයක් පමණි. මෙයින් ද්‍රව්‍ය සමූහය ඇසුරෙන් යථාරූපී චිත්‍රයක් ඇඳ වර්ණ කර නිම කිරීම අපේක්ෂා කෙරේ. මේ සඳහා ලකුණු ප්‍රදානය කිරීමේ දී අදාළ නිර්ණායකයන් යටතේ ම ලකුණු තීරණය කළ යුතු වේ. එකිනෙක නිර්ණායකයන් යටතේ අපේක්ෂකයා කොතෙක් දුරට ලඟා වී ඇත්දැයි නිවැරදි තීරණයකට එළඹ ලකුණු තීරණය කළ මැනවි. මෙහි දී තම රුචිය අනුව චිත්‍රය ඇගයීමට භාජනය නොකළ යුතු අතර අපේක්ෂකයා ප්‍රදර්ශනය කර ඇති කුසලතා තේරුම් ගෙන ඒවා පදනම් කරගෙන ඇගයීම කළ යුතු වේ.

#### ලකුණු දීමේ නිර්ණායක

| | | |
|---|---|---|
| 1 - ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත්ව සංරචනය කිරීමේ හැකියාව | - ලකුණු | 20 |
| 2 - ද්‍රව්‍යයන්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව | - ලකුණු | 20 |
| 3 - සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පර්යාලෝකය, ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මට්ටම, අවකාශ භාවිතය) | - ලකුණු | 20 |
| 4 - වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම | - ලකුණු | 20 |
| 5 - චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ථ නිමාව | - ලකුණු | 20 |
| 11. වන ප්‍රශ්න පත්‍රය සඳහා හිමි මුළු ලකුණු | - ලකුණු | 100 |



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

| | | |
|---|---|---|
| චිත්‍ර කලාව III<br>சித்திரம் III<br>Art III | 51 S III | |
| පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>*Three hours* | | අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි<br>மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்<br>Additional Reading Time - 10 minutes |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

※ ඔබේ විභාග අංකය හා තෝරාගත් ප්‍රශ්න අංකය ඔබ චිත්‍රය අඳින කඩදාසියේ **පසුපිටෙහි** පැහැදිලි ව ලියන්න.

※ දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් යන එක් මාධ්‍යයක් හෝ මෙම මාධ්‍යයන් කිහිපයක් මිශ්‍රිත ව හෝ භාවිත කළ හැකි ය.

※ අවශ්‍ය අයට විෂු කඩදාසි සපයනු ලැබේ.

※ චිත්‍රය භාර දෙන විට, එය සම්පූර්ණයෙන්ම වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින් එය ඔබට අවාසිදායක විය හැකි ය.

● පහත සඳහන් 'අ', 'ආ' සහ 'ඉ' යන කොටස් තුන අතුරෙන් **එක්** මාතෘකාවක් පමණක් තෝරාගෙන, වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.

## 'අ' කොටස - චිත්‍ර සංරචනය

1. මුහුදේදී කුණාටු සහිත ඇඩි රළ පහරකට හසු වූ ධීවරයින් සහිත යාත්‍රාවක්
2. රාත්‍රි ආගමික පෙරහැරක දසුනක්
3. රෝහලක බාහිර රෝගී ප්‍රතිකාර අංශයක අවස්ථාවක් .
4. වැව් තාවුල්ලකට පැමිණි වන සතුන් නරඹන දෙස්, විදෙස් සංචාරකයෝ

## 'ආ' කොටස - මෝස්තර නිර්මාණය

5. රෙදිපිළි මත මුද්‍රණය කිරීම සඳහා යොදාගත හැකි ව්‍යාප්ත මෝස්තරයක $9'' \times 9''$ ප්‍රමාණයේ කොටසක් වියුක්ත සත්ත්ව හැඩ ඇසුරෙන් නිර්මාණය කරන්න.
6. විදේශීය සංචාරකයින්ට අලෙවි කිරීම අරමුණු කරගත් ශ්‍රී ලාංකීය අනන්‍යතාව රැකෙන පරිදි නිර්මිත, බෑගයක මුහුණත අලංකරණයට සුදුසු විචිත්‍රවත් මුළුකල මෝස්තරයක් නිර්මාණය කරන්න.
7. පාරිසරික සුන්දරත්වය ගෘහ අභ්‍යන්තරයට එක් කරගැනීම සඳහා $5' \times 10'$ ප්‍රමාණයේ අවකාශයට සුදුසු බිතු කැටයම් සැලැස්මක් පරිමාණයට අනුකූලව ඇඳ උචිත පරිදි වර්ණ ගන්වන්න.

## 'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

8. සෞඛ්‍ය උපදෙස් පිළිපැදීම මගින් කොරෝනා වෛරසය පැරදවිය හැකි බවට සමාජය දැනුවත් කිරීමේ අරමුණින් අර්ථවත්, විචිත්‍රවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
9. '2050 අඟහරු ලොව' යන මැයෙන් ප්‍රබන්ධිත නව කථාවකට පිටකවරයක් ඇඳ, වර්ණ කරන්න. (මුල් පිටුව, ඍනකම (spine) හා පසු පිටුව අඩංගු විය යුතු ය.)
10. කාන්තාවන් සඳහා නිෂ්පාදිත දේශීය ශාකසාර මුසු වූ කේශාලේපයක් අඩංගු බෝතලයක් සඳහා ජාත්‍යන්තර වෙළඳපොළට උචිත ආකාරයේ ඇසුරුමක් සැලසුම් කර වර්ණ කරන්න.



Depatment of Examinations - Sri Lanka

## 111. පත්‍රය - "අ" චිත්‍ර සම්පිණ්ඩනය

අභිමතාර්ථ - ස්වභාවධර්මයේ දක්නට ලැබෙන ස්වාභාවික මෙන්ම නිර්මිත පරිසරයන්ගේ හා වස්තූන්ගේ ස්වභාවයන් ඒ තුළ සිදුවන සිද්ධීන් හා ක්‍රියාදාමයන් පිළිබඳවත් ලබා ඇති අත්දැකීම් චිත්‍රමය භාෂාවෙන් ප්‍රකාශ කිරීමේ නිර්මාණශීලී කුසලතාව හා රසඥතා වර්ධනය ඇගයීම.

අපේක්ෂකයන් තෝරාගෙන ඇති මාතෘකා ප්‍රකාශනය කිරීමේ දී විවිධ මට්ටමේ කුසලතා ප්‍රදර්ශනය කර ඇති අයුරු දක්නට ලැබේ. රේඛාව හැසිරවීමේ හා හැඩතල ප්‍රකාශනයේදී අවම කුසලතා මෙන් ම උපරිම කුසලතා ප්‍රදර්ශනය ක අවස්ථා දැකිය හැකි ය. වර්ණ භාවිතය තුළින් හා විවිධ වූ ශිල්ප ක්‍රම භාවිතයෙන් උපරිම කුසලතා දක්වන අය මෙන් ම ප්‍රායෝගික කුසලතා පෝෂණය කර නොගත් අපේක්ෂකයෝ ද වෙති. මේ නිසා එකිනෙක අපේක්ෂකයින් පෙන්වා ඇති ප්‍රායෝගික කුසලතාවන්ගේ මට්ටම හඳුනාගෙන ඒ අනුව නිර්ණායක පදනම් කරගෙන ලකුණු ප්‍රදානය කළ යුතු වේ. මෙහිදී ද පුද්ගල බද්ධ රුචිකත්වය ගැන නොසලකා ලකුණු ප්‍රදානය කළ මැනවි.

### ලකුණු දීමේ නිර්ණායක

1 - තෝරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේදී ඊට උචිත වාතාවරණය හා පරිසරය ප්‍රකාශ කර ඇති අයුරුව - ලකුණු 20
2 - රේඛා හැඩතල ඇසුරෙන් මානව රූ ඇතුළු සියලු හැඩතල තලය මත සම්පිණ්ඩනය කර ඇති අයුරුව - ලකුණු 20
3 - සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය ( පරිමාණ, පර්යාලෝකය, ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මට්ටම හා අවකාශ භාවිතය) - ලකුණු 20
4 - වර්ණ භාවිතයේ දක්වා ඇති කුසලතාව - ලකුණු 20
5 - අනුගමනය කර ඇති ශෛලිය හා සමස්ත නිමාව - ලකුණු 20

ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු - ලකුණු 100

## 111. පත්‍රය -"ආ" මෝස්තර හා සැරසිලි නිර්මාණය

අභිමතාර්ථ - දෛනික ජීවිතයේ ඇතිවන විවිධ අවශ්‍යතාවන්ට හා සන්නිවේදන ක්‍රියාවලියට සරිලන පරිදි නිර්මාණශීලී සැලසුම්කරණය හා අලංකරණය පිළිබඳ අපේක්ෂකයා ලබා ඇති කුසලතා පිරික්සීම

111. වැනි පත්‍රයට පිළිතුරු සැපයීමේ දී සැලෙන අපේක්ෂක සංඛ්‍යාවක් "ආ" කොටස තෝරාගන්නා බව පෙනේ. මොවුන් අතුරින් වැඩි දෙනෙක් සිද්ධාන්තමය අවබෝධයකින් යුතුව නවතාවකින් යුතු මෝස්තර නිර්මාණයේ යෙදෙන අතර අනවබෝධයෙන් මෝස්තර නිර්මාණය කිරීමට වෙහෙසෙන අයද බොහෝ ය. කෙසේ වෙතත් අපේක්ෂකයන්ගේ නිර්මාණ තුළින් පිළිබිඹු වන්නේ ඔවුන් අත්පත් කරගෙන ඇති හැකියා හා කුසලතා වන්ගේ පරිමාණයයි. නිර්ණායකයන් ඔස්සේ ඔවුන් දක්වා ඇති කුසලතාවන්ගේ ප්‍රමාණයන් තේරුම් ගෙන ලකුණු ප්‍රදානය කිරීම කළ යුතු වේ.



Department of Examinations - Sri Lanka

<u>ලකුණු දීමේ නිර්ණායක</u>

| | | |
|---|---|---|
| 1 - මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් නවතාවකින් යුතුව සැලසුම් කිරීමේ හැකියාව | - ලකුණු | 20 |
| 2 - පාරිභාරික අවශ්‍යතාවන්ට ගැලපෙන බව හා කර්මාන්තයට උචිත බව | - ලකුණු | 20 |
| 3 - රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව | - ලකුණු | 20 |
| 4 - උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව | - ලකුණු | 20 |
| 5 - විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය | - ලකුණු | 20 |
| ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | - ලකුණු | 100 |

## 111. පත්‍රය -"ඉ" ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

අභිමතාර්ථ - වාණිජ අවශ්‍යතාවන්ට හා සන්නිවේදන ක්‍රියාවලියට සරිලන පරිදි නිර්මාණශීලී සැලසුම්කරණය හා අලංකරණය පිළිබඳ අපේක්ෂකයා ලබා ඇති කුසලතා පිරික්සීම

නූතන සන්නිවේදන ක්‍රියාවලියට ගැලපෙන නිර්මාන කරුවන් බිහිකරලීමේ වැඩි නැඹුරුවක් හා ඉඩ ප්‍රස්ථා ඇති සුවිශේෂී විෂය ක්ෂෙත්‍රය වනුයේ ග්‍රැෆික් චිත්‍ර නිර්මාණයයි. එහෙත් එම විෂය පන්තිකාමරයේ ක්‍රියාත්මක වීමේ යම් ඌනතාවක් නිසාදෝ එම විෂය කොටස තෝරාගන්නා අපේක්ෂකයන්ගේ යම් අඩුවක් දක්නට ලැබේ. ඉදිරිපත් වන අපේක්ෂකයන් පවා සන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳව අනවබෝධයෙන් ඉදිරිපත් වන බව පැහැදිලිය. කෙසේ වෙතත් ප්‍රකාශ කර ඇති හැකියාවන්ගේ ප්‍රමාණයන් හොඳින් තේරුම් ගෙන, පහත සඳහන් නිර්ණායකයන් පදනම් කරගෙන ලකුණු තීරනය කිරීම අත්‍යාවශ්‍ය වේ.

<u>ලකුණු දීමේ නිර්ණායක</u>

| | | |
|---|---|---|
| 1 - මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් නවතාවකින් යුතුව සැලසුම් කිරීමේ හැකියාව | - ලකුණු | 20 |
| 2 - වාණිජමය හා සන්නිවේදන අවශ්‍යතාවන්ට ගැලපෙන බව හා කර්මාන්තයට උචිත බව | - ලකුණු | 20 |
| 3 - රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව | - ලකුණු | 20 |
| 4 - උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව | - ලකුණු | 20 |
| 5 - විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය | - ලකුණු | 20 |
| ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | - ලකුණු | 100 |

Department of Examinations - Sri Lanka

III පත්‍රය

❖ මෙම පත්‍රය කොටස් තුනකින් සමන්විත වන අතර එම කොටස් තුනෙන්ම තෝරාගත් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන එක චිත්‍රයක් පමණක් ඇඳීම අපේක්ෂා කෙරේ.
"අ" චිත්‍ර සම්පිණ්ඩනය
"ආ" මෝස්තර හා සැරසිලි නිර්මාණය
"ඉ" ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

යන කොටස් සඳහා ලැබෙන පිළිතුරු පත් ඇගයීමේදී ඒ එකිනෙකට අයත් නිර්ණායකයන්ට අනුව තක්සේරු කර ලකුණු ප්‍රදානය කළ යුතු වේ.

මේ සඳහා ද ඉහත කී අනුහුරු අභ්‍යාස පොත ඔබට මහගු අත්වැලක් සපයනු ඇත. එහි දක්වා ඇති උදාහරණ අවබෝධ කරගෙන ඒ අනුව නිර්ණායකයන්ට අනුව ලකුණු ප්‍රදානය කිරීම අත්‍යවශ්‍ය වේ.

**සටහන් ...............................**

Department of Examinations - Sri Lanka

Department of Examinations - Sri Lanka